ආයතනයේ නම : ජාතික විගණන කාර්යාලය

පාර්ලිමේන්තුවේ රජයේ ඉිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

நிறுவனத்தின் பெயர்: தேசிய கணக்காய்வு அலுவலகம்

பாராளுமன்றத்தின் அரச கணக்குகள் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புகளும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Name of the Institution: National Audit Office

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119 (4)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 183

ආයතනයේ නම - ජාතික විගණන කාර්යාලය

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය
<u>පළමු කොටස</u>	
(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව 2018 අගෝස්තු 01 දිනෙන් පසුව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අභ්‍යන්තර විගණනයේ කාර්යක්ෂමතාවය විගණකාධිපතිගෙන් බැහැරව ද අධීක්ෂණය කිරීම උදෙසා මෙම ප්‍රතිපාදනය යොදනු ලැබූ අතර ජාතික විගණන කාර්යාලයේ අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපතිවරයාගේ සෘජු අවධානයට යොමු වන බැවින් එම වාර්තා පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමක් සිදු කර නොමැත.
<u>දෙවන කොටස</u>	
(අ) තිරසාර සංවර්ධනය හා වනජීවී අමාත්‍යාංශයේ 2018.04.27 දිනැති අංක MSDW/08/65 දරන චක්‍රලේඛ විධි විධාන අනුව ඉටු කළ යුතු තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා සත් කළ යුතු නියෝජිතයන් දෙදෙනා පිළිබඳව විස්තර තිරසාර සංවර්ධන හා වන ජීවී අමාත්‍යාංශය වෙත වාර්තා කර නොතිබුණි.	**චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නියෝජිතයන් දෙදෙනකු පිළිබඳ විස්තර අමාත්‍යාංශයට වාර්තා කර නොතිබුණද තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව අමාත්‍යාංශය සමඟ අධීක්ෂණ මට්ටමින් කටයුතු කිරීමට තිරන්තරවම නිලධාරීන් දෙදෙනකු යොදවා තිබුණු අතර එම නිලධාරීන් ඊට අදාළ සක්‍රීය දායකත්වය ලබා දී තිබුණි. මේ වන විට එම නියෝජිතයන් දෙදෙනා පිළිබඳව විස්තර අමාත්‍යාංශයට වාර්තා කර ඇත. තවද ජාතික විගණන පනත ක්‍රියාත්මක කරවන විගණකාධිපති වෙත මෙම විධිවිධානය සෙසු ආයතන ලෙසම අදාල නොවන අතර ජාතික විගණන කාර්යාලයට අදාල ස්වාධීන විගණනය ගරු කථානායක තුමා විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණන සමාගමක් විසින් සිදු කරනු ලබන හෙයින් ජාතික විගණන කාර්යාලයට අදාල විගණනය පිළිබඳව කළමණාකරන විගණන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයේ අවශ්‍යතාවයක් පැන නොනගී.**

ලත් විගණකවරයකු පත් කිරීම ප්‍රමාද වීම මත එම විගණකගේ වාර්තාව ලැබීම ප්‍රමාද විය. විෂයගත ප්‍රශ්ණාවලියට පිළිතුරු සපයන විට එකී විගණන වාර්තාව ලැබී නොතිබුණු බැවින් අදාල විගණන මතය කුමක්දැයි සඳහන් කර නොතිබුණු අතර වෙනත් කරුණු යටතේ ඒ බව සඳහන් කර තිබුණි. කෙසේ වෙතත් 2020 වර්ෂය සඳහා තත්ත්වාගණනය නොකළ මතය ඇතුළත් විගණන වාර්තාවක් ලැබී ඇත.

(උ) සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.

2020 වර්ෂයේ පැවති COVID 19 වසංගතය තත්ත්වය හේතුවෙන් සෞඛ්‍ය අංශ නිර්දේශවලට යටත්ව එම කටයුතු කළ යුතු වීම නිසා දිවයින පුරා විසිර සිටින නිලධාරීන් කැඳවා පුහුණු සැසි පැවැත්වීමට නොහැකි වීම මෙම තත්වයට මූලික හේතුව විය. මූල්‍ය ප්‍රකාශන විගණනයට අදාළව කාලීනව අත්‍යවශ්‍යම පුහුණු සැසි පමණක් සුදුසු පරිදි සම්මුඛව සහ සූම් තාක්ෂණය ඔස්සේ පවත්වා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
306 / 72, පොල්දූව පාර,
බත්තරමුල්ල.